**වැල්ලවාය ප්‍රාදේශීය සභාව - 2022**

**--------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

වැල්ලවාය ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට වැල්ලවාය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේමූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත්කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත .

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුවප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 වර්ෂය තුළ මිලදී ගත් රු.23,550 ක පුස්තකාල පොත්වල වටිනාකම රු.116,420 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේ දී මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී පුස්තකාල පොත් ශේෂය රු.92870ක් වැඩියෙන් දැක්වීම නිවැරදි කරමි. | මිලදී ගත් පුස්තකාල පොත් වටිනාකම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | ඉකුත් වර්ෂයේ පුස්තකාල පොත් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවන ලද රු.500,000 ක් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2023 මූල්‍ය ප්‍රකාශන සකස් කිරිමේදී ණය හිමි වෙන් කිරීම් හා ප්‍රවර්ථන වියදම් පිළිබඳ පරීක්ෂා කර බලා ගිණුම් සටහන තැබීමට කටයුතු කරමි. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමේදී අදාල කාල පරිච්ඡේදය නිවැරදිව හඳුනාගත යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පරිභෝජනය කළ ආයුර්වේද තොගය රු.84,665 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | ආයුර්වේද තොග ලේඛනය පරීක්ෂා කර ශේෂයන් නිවැරදි කිරීමට කටයුතු කරමි. | තොග වටිනාකම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | සභාව විසින් පවත්වාගෙන යනු ලබන ණයහිමි ලේඛනයේ ඇතුලත් රු.492,898 ක ණයහිමි ශේෂ විවිධ ණයහිමියන් යටතේ දක්වා නොතිබුණි. | කාර්යාලයේ ණය හිමි ලේඛනය පරීක්ෂා කර බලා ඉදිරියේ දී නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. | ණයහිමි වටිනාකම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය තුල ආනපල්ලම ආදාහනාගාරයේ නල ළිඳ සඳහා ජල පොම්පයක් සවිකිරීම වෙනුවෙන් වැයකරන ලද රු.320,000 ක වියදම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | 2023 මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී මෙම වියදම ප්‍රාග්ධනිත කරමි. | සමාලෝචිත වර්ෂයේ මිලදි ගත් සියලු වත්කම්වල වටිනාකම හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | වැල්ලවාය සතිපොළ බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාලව සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රාදේශීය සංවර්ධන සහයක ව්‍යාපෘති කාර්යාලයෙන් ලැබිය යුතු රු.1,906,431 ක අතරුදවුම් මුදල හිඟ හිටි ප්‍රාග්ධන ආධාර යටතේ දක්වා නොතිබුණි. | 2023 මූල්‍ය ප්‍රකාශන සැකසීමේදි ලැබිය යුතු කර්මාන්ත ආධාර උපලේඛනයට ගැලපුම් කර මෙම වරද නිවැරදි කරමි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (උ) | සමාලෝචිත වර්ෂය තුල මහින්ද රාජපක්ෂ සම්මන්ත්‍රණ ශාලාවේ වැසිකිලි පද්ධතිය අලුත්වැඩියාව සඳහා ලබාදී තිබුණු රු. 185,000 ක කොටස් මුදල මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ලැබිය යුතු දැ යටතේ සෘණ ශේෂයක් ලෙස දක්වා තිබුණි. | අදාල කර්මාන්ත ගෙවීම් බිල්පත් විස්තරය පරීක්ෂා කර ශේෂ නිවැරදි කිරීම් සිදු කරමි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන වෙන්කර නොතිබුණි. | 2022 වාර්ෂික අයවැය ලේඛණයේ වැය ශීර්ෂ 105.9 වෙනත් වියදම් ශීර්ෂය යටතේ රු.10,000 ක ප්‍රතිපාදන වෙන් කර ඇත. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමේදි වෙන්කිරිම් නිවැරදිව කළ යුතුය. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 02 කට අදාලව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ශේෂයන් හා ඒ සඳහා ලබාදී ඇති උපලේඛන හා ලේඛන අනුව ශේෂයන් අතර රු.2,996,281ක වෙනසක් විය. | අදාල හිඟ ශේෂ මූල්‍ය ප්‍රකාශන වල නිවැරදි බවත් දැනට භාවිතා නොකරන දේපලවලට අදාල හිඟයන් ලේඛනවල නොමැති බවත් තොරතුරු සොයා ලේඛනයට ඇතුළත් කිරීම සඳහා විෂය නිළධාරිනියට උපදෙස් ලබා දුන් බවත් දන්වමි. | ලේඛන හා උපලේඛන නිවැරදිව යාවත්කාලීනකර නොසැසදීම්වලට හේතු සොයා නිවැරදි කළ යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතු වටිනාකම රු.276,989,839 ක් වූ වත්කම් හා වගකීම් විෂයයන් 06ක් සම්බන්ධයෙන් තක්සේරු වාර්තා, කාල විශ්ලේෂණ, ලේඛන සහ උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරිමට නොහැකි විය. | සභාවට අයත් ඉඩම් තක්සේරු කර නිරවුල් කර ගැනීමටත් අනෙකුත් ලේඛන සහ උපලේඛන යාවත්කාලීනව පවත්වාගෙන යාමටත් ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු රෙ 1646 | 2022 වර්ෂයට අදාලව සභාව සතු වාහන 06 ක ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | සභාව සතු සෑම වාහනයකටම ධාවන සටහන් සෑම මසකම විගනකාධිපති වෙත යොමු කිරීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්ගේ 2010 අගෝස්තු 17 දිනැති චක්‍රලේඛය | සභාව විසින් පවත්වාගෙන තිබුණු වීථි පහන් ලේඛනය අනුව, සභා බලප්‍රදේශයේ වීථි පහන් 1585 ක් සවිකර තිබුණද, වීථි ආලෝක කරණය සම්බන්ධයෙන් ලංකා විදුලිබල මණ්ඩලය සමඟ ගිවිසුම්ගතවී නොතිබුණි. | වල් අලි තර්ජනය හා සොරසතුරු තර්ජන සහිත ස්ථාන වලට විදුලි බල මණ්ඩලය සමඟ සාකච්ඡා කර වීථි ලාම්පු සවිකරණ ලදි.ඉදිරියේදී ගිවිසුම් ගත වීමට අවශ්‍ය කටයුතු කරමි. | චක්‍රලේඛය පරිදි ක්‍රියාකළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 14,240,661ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 15,871,403 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 6,246,032 | 6,092,873 | 2,037,152 | 3,862,439 | 6,396,032 | 6,029,505 | 2,634,785 | 4,339,154 |
| (ii) | කුලී | 15,116,000 | 10,264,672 | 5,445,948 | 4,832,094 | 16,760,400 | 8,866,457 | 3,732,217 | 5,174,359 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 6,361,025 | 2,201,106 | 2,156,106 | 45,000 | 8,352,250 | 1,858,495 | 1,807,495 | 51,000 |
| (iv) | වෙනත් ආදායම් | 2,987,000 | 1,755,755 | 483,272 | 1,272,483 | 2,762,000 | 5,226,027 | 447,082 | - |
| | එකතුව | 30,710,057 | 20,314,406 | 10,122,478 | 10,012,016 | 34,270,682 | 21,980,484 | 8,621,579 | 9,564,513 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ බිල්කරන ලද රු.20,314,406 ක් වූ මුළු ආදායමෙන් වර්ෂය අවසාන වන විට රු.10,012,016 ක් අයකර නොතිබුණු අතර එය මුළු බිල්කල ආදායමෙන් සියයට 49 ක් විය. | ප්‍රවර්ථන වර්ශයේ මුළු බිල් කල ආදායමෙන් සියයට 50ට වඩා අයකර ගෙන ඇති අතර පසුගිය වර්ෂයට සාපේක්ෂව ප්‍රගතියක් පෙන්නුම් කරයි.හිඟ ආදායම් කඩිනමින් අය කර ගැනීමට කටයුතු කරමි. | බිල්කල ආදායම් රැස් කර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ බිල් කරන ලද රු.6,015,905 ක් වූ වරිපනම් බදු ආදායමෙන් 2022 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු රු. 3,844,575 ක් වූ අතර එය මුළු බිල් කළ වටිනාකමින් සියයට 64 ක් විය. සමාලෝචිත වර්ෂය ආරම්භයේදී පැවති හිඟ වරිපනම් බදු අයවීමේ ප්‍රතිශතය සියයට 16 ක් විය. | වර්ෂ ගණනාවක්ම දිගින් දිගට හිඟ හිටි වරිපනම් බදු පැවතීම නිසා අයකරන බදු හිඟ මුදලින් හිලව් කරන බැවින් ප්‍රවර්ථන අයවීම් පහත මට්ටමක පවතී. වර්ෂ කිහිපයක සිට ආදායම් පරීක්ෂක තනතුරු පුරප්පාඩුව පවතින බැවින් ආදායම් ආයකිරීම පහත මට්ටමක පවතින අතර පුරප්පාඩු පිරවීමට ඉල්ලීම් කර ඇත. | බිල්කල ආදායම් රැස් කර ගත යුතු අතර හිඟ වරිපනම් බදු කඩිනමින් අයකර ගත යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය ආරම්භයේදී පැවති රු. 7,603,482 ක හිඟ ටෙන්ඩර් දේපල බදු ආදායමෙන් 2022 දෙසැම්බර් 31 දිනට රු. 7,138,378 ක් තව දුරටත් අයකරගත යුතුව පැවතුණි. ඒ අනුව හිඟ ටෙන්ඩර් දේපල බදු ආදායම අයවීමේ ප්‍රතිශතය සියයට 6 ක් විය. | වසර ගණනාවක සිට ලේඛනවල පවතින හිඟ බදු අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් සාක්ෂි සෙවීම අසීරු බැවින් අයකිරීම් ප්‍රමාද වී ඇති අතර තොරතුරු සොයා කඩිනමින් අයකිරීමට කටයුතු කරමි. | හිඟ බදු ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ බදු දී තිබුණු කඩ කාමර 144 කින් අයවිය යුතු රු.5,055,960 කින් 2022 දෙසැම්බර් 31 දිනට හිඟ කඩ කාමර කුලි රු.4,224,874 ක් වූ අතර එය මුළු බිල් කළ ආදායමෙන් සියයට 84 ක් විය. | කඩ කාමර කුලී දිගින් දිගටම හිඟව පවතින නිසා ප්‍රවර්ථන වර්ෂයේ අයවන කුලී මුදලින් වැඩි ප්‍රතිශතයක් හිඟ කඩ කුලී සඳහා හිලව් කිරීම නිසා ප්‍රවර්තන කඩ කුලී අයවීම පහත මට්ටමක පවතී. දිගින් දිගටම ආදායම් පරීක්ෂක තනතුරු පුරප්පාඩුව පැවතීම හා රටේ පවතින ආර්ථික පසුබෑම හේතුවෙන් අයකිරීම් අපහසු වී ඇත .කඩිනමින් හිඟ කුලී අය කිරීම සඳහා විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට යෝජිතය. | හිඟ කඩකුලී ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ඉ) | සභා බලප්‍රදේශය තුල විවිධ ආයතන/පුද්ගලයින් විසින් ප්‍රදර්ශනය කර තිබුණු ස්ථාවර ප්‍රචාරක දැන්වීම් පුවරු 16 කින් 2017 -2022 කාල පරිච්ඡේදයට අදාලව අයවිය යුතු රු. 347,350 ක් 2022 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි. | 2017-2022 කාල පරිච්ජේදය තුල ස්ථාපිත කර තිබූ දැන්වීම් පුවරු ප්‍රවර්ථන වර්ෂය වන විට ගලවා ඉවත් කරගෙන ඇති බැවින් අයකිරීම් අපහසුවී ඇති බව කාරුණිකව දන්වමි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභා බල ප්‍රදේශය තුල ස්ථාපිත කර තිබුණු දුරකථන සම්ප්‍රේෂණ කුළුණු 18 කින් අයවිය යුතු රු. 201,000 ක ව්‍යාපාර බදු අයකර ගෙන නොතිබුණි. | ආදායම් පරීක්ෂකවරු යොදවා ක්ෂේත්‍ර පරීක්ෂණයක් මඟින් සියළු සම්ප්‍රේෂණ කුළුණු සඳහා බලපත්‍ර ගාස්තු අයකිරීමට කටයුතු කරමි. | හිඟ ව්‍යාපාර බදු කඩිනමින් අයකර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.1,207,932 ක් සහ මුද්දර ගාස්තු රු.11,620,091 ක් ගෙන්වාගෙන නොතිබුණි. | හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු අයකර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. | හිඟ උසාවි දඩ සහ මුද්දර ගාස්තු ගෙන්වා ගත යුතුය. |
| (ඌ) | 2013 සිට 2022 කාල පරිච්ඡේදයට අදාලව සභාවට අයත් යන්ත්‍ර 02 ක් කුලියට දීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.6,605,201 ක හිඟ යන්ත්‍ර කුලී ආදායම අයකරගෙන නොතිබුණි. | හිඟ යන්ත්‍ර කුලී අය කිරීම සඳහා ලිපි කිහිපයක් නිකුත් කර ඇති අතර නීතිමය කටයුතු මඟින් කඩිනමින් අයකිරීමට කටයුතු කරමි. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එක් පළාත් පාලන ආයතනයකට එක් ග්‍රාමීය ක්‍රීඩා පිටියක් බැගින් ක්‍රීඩාංගන 33 ක් සංවර්ධනය කිරීමේ ජාතික වැඩ සටහන යටතේ රු.1,470,000 ක් වැයකර 2021 නොවැම්බර් 08 දින වැඩ නිමකර තිබුණු රන්දෙණිගොඩ යාය ක්‍රීඩාපිටිය 2022 ඔක්තෝබර් 12 දින වන විටත් ක්‍රීඩා කටයුතු සඳහා යොදා නොගැනීම හේතුවෙන් එහි වල් බිහි වී පැවතුණි. | රන්දෙණිගොඩයාය ක්‍රීඩාපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය භාරයේ පවතින බැවින් ප්‍රාදේශීය සභාවට පවරාගෙන ක්‍රීඩා කටයුතු සඳහා යොමු කිරීමට අවශ්‍ය කටයුතු කරමි. | වියදම් දැරීමේදී එම වියදමේ ආර්ථිකමයභාවය කෙරෙහි සැලකිලිමත් විය යුතු අතර වත්කම් කාර්යක්ෂමව ප්‍රයෝජනයට ගත යුතුයි. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවට අයත් පුස්තකාල 04 ක 2001 වර්ෂයේ සිට 2019 දෙසැම්බර් 31 දක්වා කාල පරිච්ඡේදය තුල පාඨකයින්ට ලබා දී තිබුණු රු. 75,217 ක් වටිනා පුස්තකාල පොත් 477 ක් 2023 මාර්තු 30 දින වන විටත් නැවත භාර දී නොතිබුණි. | පොත් ගෙන්වා ගැනීමට ලිපි නිකුත් කලද ලිපිනයන් වෙනස්වීම නිසා අදාල අය සෙවීම අපහසු වී ඇත .දැනට ආදේශක පොත් 200ක් ලබාගෙන ඇති බැවින් පුස්තකාල උපදේශන කමිටුවට ඉදිරිපත් කර ඉදිරි කටයුතු කරමි. | පාඨකයින්ට නිකුත්කළ පොත් නැවත ලබාගත යුතුය. |
| (ආ) | සභාවට අයත් බවට ස්ථාවර වත්කම් ලේඛනවල සඳහන් කර තිබුණ ද, භෞතික පැවැත්ම තහවුරු නොකෙරුණු තක්සේරු වටිනාකම රු. 63,300 ක් වූ ඉඩම් 5 ක් හා තක්සේරු වටිනාකම රු. 152,000 ක් වූ ගොඩනැගිලි 3 ක් ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගතකර තිබුණි. | දිගින් දිගටම වසර ගණනාවක සිට ගිණුම්වල පැවත එන ස්ථාවර වත්කම් නිසා භෞතිකව හඳුනාගෙන ආරක්ෂා කිරීමට අවශ්‍ය කටයුතු කරමි. සංවර්ධන කටයුතු වලදී දැනට වසර 20කට පමණ පෙර කඩා ඉවත් කරන ලද ගොඩනැගිලි බැවින් ලේඛන වලින් ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමි. | සභාවට අයත් ඉඩම් සහ ගොඩනැගිලිවල භෞතික පැවැත්ම තහවුරුකර ගැනීමට කටයුතු කල යුතුය. |

### 3.3 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවට අයත් බවට හඳුනාගෙන තිබුණු ඉඩම් 19 ක සහ සුසාන භූමි 71 ක වටිනාකම තක්සේරුකර ගිණුම්ගතකර නොතිබුණි. | අදාල ඉඩම් හා සුසාන භූමි මැණුම් කටයුතු සිදු කර තක්සේරු කිරීම සඳහා සහා අරමුදල් තත්වයද සලකා අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරමි. | සභාවට අයත් ඉඩම් සහ සුසාන භූමිවල වටිනාකම තක්සේරු කර ගිණුම් ගතකල යුතුය. |

### 3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභා අරමුදලින් රු. 553,476 ක් වැයකර කැහැලිය ගොවි සංවිධාන ගොඩනැගිල්ලේ බිත්ති බැඳ වහලය ඉදිකිරීමේ කටයුතු 2022 ජුනි 01 දින අවසන් කර තිබුණු අතර බිත්ති බැඳීම සඳහා ගෙවීම් කිරීමේ දී වැරදි ලෙස මැනුම් කිරීම හේතුවෙන් රු. 31,746 ක් සහ කපරාරු සඳහා රු.5,630 ක් ලෙස මුළු එකතුව රු. 37,106 ක් වැඩිපුර ගෙවා තිබුණි. එමෙන්ම ගොඩනැගිල්ලේ දොර සහ ජනෙල් සඳහා ඇස්තමේන්තුව සහ මැනුම් පත්‍රවල දක්වා තිබුණු පරිදි පළමු පන්තියේ දැව යොදා ගැනීම, තීන්ත ආලේප කිරීම සහ පිත්තල සරනේරු සහ උපාංග යොදා නොතිබුණු අතර ඊට අදාලව ගෙවා තිබුණු රු.67,543 ක් වැඩිපුර ගෙවීම් බව නිරීක්ෂණය විය. | විගණන අවස්ථාවේ මිණුම්වල යම් යම් අඩුපාඩු සිදුවී ඇති නිසා නැවත නිවැරදි මිනුම් ලබාගෙන නිවැරදි මිනුම්පත්‍ර හා සියළු අඩුපාඩු සම්පූර්ණ කර අදාල ඡායාරූප විගණනයට ඉදිරිපත් කර ඇති බව කාරුණිකව දන්වමි . | පිළිතුර පිළිගත නොහැකි අතර ඇස්තමේන්තු පරිදි ඉදිකිරීම් කටයුතු කල යුතු අතර මිනුම් පත්‍ර නිවැරදිව සකස් කල යුතුය. |

### 3.5 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ තනතුරු 06 කට අදාලව අනුමත කාර්ය මණ්ඩලය අනුව සේවකයින් 07 දෙනෙකුගේ ඌනතාවයක් පැවති අතර විගණිත දිනය වූ 2023 මාර්තු 30 දින වන විටත් එම පුරප්පාඩු පිරවීමට කටයුතුකර නොතිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කර දෙන ලෙස පළාත් පාලන කොමසාරිස්තුමාට ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. | කාර්යමණ්ඩලයේ පුරප්පාඩු පුරවාගත යුතුය. |
| (ආ) | සභාවේ සේවය කරන සේවකයන් 05 දෙනෙකුගෙන් අයවිය යුතුව පවතින රු. 31,250 ක උත්සව අත්තිකාරම් හා රු.2,800 ක විශේෂ අත්තිකාරම් ණය ශේෂ 2022 දෙසැම්බර් 31 දින වන විටත් අයකරගෙන නොතිබුණි. | දැනට සේවය කරන අයගෙන් ණය කඩිනමින් අයකර ගැනීමටත් සේවය නොකරන අයගේ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමටත් නිලධාරින්ට උපදෙස් ලබා දෙන ලදී. | අදාල කාල සීමාවන් තුල ණය අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රාදේශීය සභාව විසින් පිළියෙලකර තිබුණු අයවැය ලේඛනය මඟින් ඇස්තමේන්තු කළ ආදායම් හා වර්ෂයේ තථ්‍ය ආදායම් අතර සියයට 2 සිට සියයට 65 දක්වා ද, ඇස්තමේන්තු කළ වියදම් හා වර්ෂයේ තථ්‍ය වියදම් අතර සියයට 2 සිට සියයට 88 දක්වා සැලකිය යුතු විචලනයන් පවතින බැවින් ආදායම් හා වියදම් පාලනයේදී අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි. | කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා යන්ත්‍ර සූත්‍ර නොමැති වීම, ඉන්දන හිඟය හා සංවර්ධන වැඩසටහන් අවම වීම, සම්මන්ත්‍රණශාලා උත්සව සීමිත වීම ආදිය නිසා ආදායම් විචලන පැවති බවත් ඉදිරි අයවැය සකස් කිරීමේදී විශේෂ අවධානයක් යොමුකරන බවත් දන්වමි. | නිවැරදි අයවැය ලේඛනයක් පිළියෙල කර එහි දක්වා ඇති ඉලක්ක සපුරා ගත යුතුය. |